# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2022 පෙබරවාරි මස 03 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2022.02.10 දින නිකුත් කරන ලදී)**


# බුද්ධිමය දේපළ (සංශෝධන)

**2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

වෙළෙඳ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

**මිල : රු. 36.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සහ පරිපාලනය කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස "භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමේ පද්ධතියක්" හඳුන්වාදීම පිණිස 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත මෙම පනත් කෙටුම්පත මගින් සංශෝධනය කරනු ලැබේ.

එල්.ඩී.–ඕ. 8/2020

**2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය

**1.** මේ පනත 2022 අංක      දරන බුද්ධිමය දේපළ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2003 අංක 36 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ "කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර, ලකුණු සහ වෙනත් යම් කාරණා" යන වචන වෙනුවට "කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර, ලකුණු, භූගෝලීය දර්ශක සහ වෙනත් යම් කාරණා" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) (1) වන උපවගන්තියේ "කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර, ලකුණු හා පනතින් විධිවිධාන සලසා ඇති පරිදි වෙනත් යම් කාරණයක්" යන වචන වෙනුවට "කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර, ලකුණු, භූගෝලීය දර්ශක හා පනතින් විධිවිධාන සලසා ඇති පරිදි වෙනත් යම් කාරණයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) (2) වන උපවගන්තියේ "කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර, ලකුණු හා පනතින් විධිවිධාන සලසා ඇති පරිදි වෙනත් යම් කාරණයක්" යන වචන වෙනුවට "කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර, ලකුණු, භූගෝලීය දර්ශක හා පනතින් විධිවිධාන සලසා ඇති පරිදි වෙනත් යම් කාරණයක්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තියේ "භූගෝලීය දර්ශකය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 160 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 160 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "නව නිපැයුම්, කාර්මික සැලසුම්, ලකුණු, වෙළෙඳ නාම" යන වචන වෙනුවට, "නව නිපැයුම්, කාර්මික සැලසුම්, ලකුණු, වෙළෙඳ නාම, භූගෝලීය දර්ශක" යන වචන ආදේශ කිරීමෙන්;

(2) (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iv) වන අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(iv) භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලිය හෝ භාණ්ඩ හෝ සේවා ඇතුළු භාණ්ඩවල භූගෝලීය දර්ශක පිළිබඳව;".

ප්‍රධාන ප්‍රඥප්තියට 160අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ IX වන කොටසේ "භූගෝලීය දර්ශකය" යන ශීර්ෂයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 160අ වගන්තිය ලෙස බලාත්මක වන්නේ යː-

"අර්ථ නිරූපණය

160අ. මේ කොටසේ කාර්ය සඳහා පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස-

"බලයලත් භාවිතකරු" යන්නෙන්, මේ පනතේ මේ කොටස යටතේ ලියාපදිංචි කර ඇති යම් භූගෝලීය දර්ශකයක් භාවිත කරන්නකු අදහස් වේ;

"පාලක සැලසුම" යන්නෙන්, නිෂ්පාදන පිරිවිතරවලට අනුකූලව කටයුතු කිරීම තහවුරු කිරීම සත්‍යායනය කරනු ලබන ආකාරය පිළිබඳ ක්‍රමවේදය අදහස් වේ;

"භූගෝලීය දර්ශකය" යන්නෙන්, යම් රටක දේශ සීමා තුළින් හෝ එම දේශ සීමා තුළ යම් ප්‍රදේශයකින් හෝ පළාතකින් සම්භවය වන යම් භාණ්ඩ ලෙස හඳුනා ගනු ලබන, එම

භාණ්ඩයේ දෙනු ලබන යම් ගුණාංගයක්, කීර්ති නාමයක් හෝ වෙනත් ආවේණික ලක්ෂණයක් එහි භූගෝලීය සම්භවයට අත්‍යාවශ්‍යයෙන්ම ආරෝපණය වන්නා වූ යම් දර්ශකයක් අදහස් වේ;

"භාණ්ඩ" යන්නෙන්, යම් නිෂ්පාදිත හෝ ස්වාභාවිකව පවතින කෘෂිකාර්මික නිෂ්පාදන ආහාර, වයින් ස්ප්‍රීතු හෝ වෙනත් යම් අත්කම් හෝ කාර්මික අයිතම අදහස් වේ;

භාණ්ඩ සම්බන්ධයෙන් වන විට, "නිෂ්පාදකයා" යන්නෙන්-

(අ) එම භාණ්ඩ කෘෂිකාර්මික නිෂ්පාදන, වයින් හෝ ස්ප්‍රීතු වන්නේ නම්, එම භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන, සැකසුම් කරනු ලබන හෝ ඇසුරුම් කරනු ලබන;

(ආ) එම භාණ්ඩ ස්වාභාවික භාණ්ඩ වේ නම්, එම භාණ්ඩ උපයෝජනය කරනු ලබන; හෝ

(ඇ) එම භාණ්ඩ අත්කම් හෝ කාර්මික භාණ්ඩ වේ නම්, එම භාණ්ඩ සාදනු ලබන හෝ නිෂ්පාදනය කරනු ලබන,

යම් තැනැත්තකු අදහස් වේ; සහ

"පිරිවිතර" යන්නෙන්, භාණ්ඩ හෝ නිෂ්පාදනවල ආවේණික ලක්ෂණ, නිෂ්පාදන ක්‍රමවේදය, භූගෝලීය ප්‍රදේශය සහ භාණ්ඩ හෝ නිෂ්පාදනවල ආවේණික ලක්ෂණ, ගුණාත්මකභාවය හෝ කීර්ති නාමය සහ එහි භූගෝලීය සම්භවය අතර සම්බන්ධතාවය පිළිබඳ තාක්ෂණික විස්තර සපයනු ලබන්නා වූ යම් භූගෝලීය දර්ශකයක් ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ලේඛනයක් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 161 වන වගන්තිය සංශෝධනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 161 වන වගන්තියේ (4අ) සහ (5) උපවගන්ති ඉවත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 161අ, 161ආ, 161ඇ, 161ඈ සහ 161ඉ අලුත් වගන්ති ඇතුළත් කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 161 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර, එම වගන්ති එකී ප්‍රඥප්තියේ 161අ, 161ආ, 161ඇ, 161ඈ සහ 161ඉ වගන්ති ලෙස බලාත්මක වන්නේ යඃ-

"ලියාපදිංචිය සඳහා භූගෝලීය දර්ශකවල ආවේශ්‍යතාව

161අ. (අ) 160අ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති භූගෝලීය දර්ශකය පිළිබඳ අර්ථ නිරූපණය සමඟ අනුකූල නොවන්නා වූ;

(ආ) භාවිත කිරීම නීතියට, සදාචාරයට, ආගමට, පිළිගත් සිරිත් විරිත් හෝ මහජන සාමයට පටහැනි වන්නා වූ;

(ඇ) සම්භවිත රටෙහි භූගෝලීය දර්ශකයක් ලෙස ආරක්ෂා නොවන හෝ ආරක්ෂා කිරීම අවසන් වන හෝ එම රටේ අභාවිතයට වැටුණු;

(ඈ) පොදු භාෂා ව්‍යවහාරයේ දී අදාළ භාණ්ඩයේ පොදු නාමය වශයෙන් සාම්ප්‍රදායිකව පවතින යෙදුම හා අනන්‍ය වන්නා වූ;

(ඉ) භාණ්ඩයේ හෝ එහි භාවිතයේ ආවේණික ලක්ෂණ, ස්වභාවය, ගුණාත්මකභාවය, සම්භවය වූ ස්ථානය සහ නිෂ්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් මහජනතාව නොමඟ යවන සුලු හෝ රවටන සුලු;

(ඊ) පැළෑටි විවිධත්වය හෝ සත්ව පෙළපතක නාමයකින් සංයුක්ත වන්නා වූ,

යම් භූගෝලීය දර්ශකයක් මේ පනත යටතේ ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.

භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීම

161ආ. (1) (මෙහි මින්මතු "ඉල්ලුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් අදාළ භාණ්ඩයක් නිෂ්පාදකයන්ගේ සම්බන්ධතා නියෝජනය කරනු ලබන යම් පුද්ගල සංවිධානයක් නිෂ්පාදකවරුන්ගේ සංවිධානයක් හෝ තත් කාලයේ වන යම් නීතියක් මගින් පිහිටුවා ඇති යම් සංවිධානයක් හෝ අධිකාරියක් විසින් එම භාණ්ඩය භූගෝලීය දර්ශකයක් වශයෙන් ලියාපදිංචි කරන ලෙස නියම කරනු ලබන ආකාරයට සහ ආකෘතියෙන් නියම කරනු ලබන යම් ලේඛන සහ පරීක්ෂා කිරීමේ ගාස්තු සමඟ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) ඉල්ලුම් පත්‍රයක්, ලැබීමෙන් පසුව, නියම කර ඇති ආකාරයට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම ඉල්ලුම් පත්‍රය පරීක්ෂා කර බැලිය යුතු ය.

(3) ලියාපදිංචි කිරීමට අපේක්ෂිත යම් භූගෝලීය දර්ශකයක් 161අ වගන්තිය ප්‍රකාරව ලියාපදිංචිය සඳහා ආවේශ්‍ය නොවන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම භූගෝලීය දර්ශකය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ යුතු අතර, ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීමට හේතු ඉල්ලුම්කරුට දැනුම් දෙනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, මෙම වගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද යම් ඉල්ලුම් පත්‍රයක දෝෂයක් පවතින අවස්ථාවක දී, එම ඉල්ලුම් පත්‍රයේ දින සිට මාස තුනක කාලයක් ඇතුළත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම දෝෂය පිළිබඳව ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු අතර, එම දැන්වීමේ දිනයේ සිට මාස තුනක් ඇතුළත ඒ දෝෂය නිදොස් කිරීම සඳහා ඉල්ලුම්කරු වෙත අවස්ථාවක් ලබා දිය යුතු ය. ඉල්ලුම්කරු විසින් නිදොස් කරන ලද ඉල්ලුම් පත්‍රය අධ්‍යක්ෂ ජනරාල්වරයාට නැවත භාරදෙන ලද දිනය එම ඉල්ලීම ලියාපදිංචිය සඳහා භාර ගැනීමේ දිනය ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ස්වකීය ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කර ඇති යම් ඉල්ලුම්කරුවකු විසින්, එම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ

ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වන ලද හේතු සම්බන්ධයෙන් සෑහීමට පත් නොවන්නේ නම්, ඉල්ලුම්කරු වෙත එම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව දැනුම් දුන් දිනයේ සිට මාස තුනක් ඇතුළත එම ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව ස්වකීය කරුණු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) ඒ කරුණු ලැබීමෙන් පසුව, එම කරුණුවලට අදාළ කාරණාව විභාග කිරීම උචිත බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලබන්නේ නම්, ඒ සඳහා ඉල්ලුම්කරු වෙත දිනයක්, වේලාවක් සහ ස්ථානයක් පිළිබඳව දැනුම් දිය හැකි ය.

(6) එම විභාගය අවසන් වීමෙන් පසුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ එය ඒ ආකාරයටම ලියාපදිංචි කිරීම හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් උචිත යයි සලකනු ලබන ආකාරයට එම භූගෝලීය දර්ශකය භාවිත කිරීමේ ක්‍රමය හෝ ස්ථානය පිළිබඳව යම් කොන්දේසි, සංශෝධන හෝ සීමා කිරීම්වලට යටත්ව ලියාපදිංචි කරනු ලැබිය හැකි ය.

(7) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම් ඉල්ලුම් පත්‍රයක් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබූ විටක හෝ (6) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි යම් කොන්දේසිවලට යටත්ව යම් ඉල්ලුම් පත්‍රයක් ලියාපදිංචි කරනු ලබන විටක ඉල්ලුම්කරු විසින් ඉල්ලා සිටියහොත්, එම ප්‍රතික්ෂේප කිරීම හෝ ලියාපදිංචි කිරීම සඳහා වූ කොන්දේසි සහිත පිළිගැනීම පිළිබඳ හේතු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

ඉල්ලුම් පත්‍රය පළකිරීම

161ඇ. (1) ලියාපදිංචි කිරීමට අපේක්ෂිත භූගෝලීය දර්ශකය 161අ වගන්තිය යටතේ ආවේශ්‍ය වන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් කරන අවස්ථාවක, එම ඉල්ලීම පළකිරීම සඳහා වූ නියමිත ගාස්තුව ලැබීමෙන් පසුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත එම ඉල්ලුම් පත්‍රය ලැබීමේ දින සිට මාස දෙකක

කාලසීමාවක් ඇතුළත, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම ඉල්ලුම් පත්‍රය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය. නියමිත කාලසීමාව ඇතුළත එම නියමිත ගාස්තුව ගෙවීමට ඉල්ලුම්කරු අපොහොසත් වන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම භූගෝලීය දර්ශකය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම් පත්‍රය පළකිරීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පහත දැක්වෙන කරුණු නිශ්චිතව දක්වනු ලැබිය යුතු යː-

(අ) ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය;

(ආ) ඉල්ලුම් පත්‍රයේ දිනය;

(ඇ) භූගෝලීය දර්ශකය නියෝජනය කිරීම;

ඈ) භූගෝලීය දර්ශකය ලියාපදිංචි කිරීමට අපේක්ෂිත භාණ්ඩ;

(ඉ) පිරිවිතර පිළිබඳ සාරාංශය සහ භූගෝලීය ප්‍රදේශයේ සිතියම; සහ

(ඊ) ඉල්ලුම්කරු ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන්නේ නම්, ශ්‍රී ලංකාව තුළ දී ලිපිලේඛන භාරදීම සඳහා වූ තැපැල් ලිපිනයක්.

ලියාපදිංචිය සඳහා විරෝධය දැක්වීම

161ඈ. (1) 161ඇ වගන්තිය යටතේ පළකරන ලද භූගෝලීය දර්ශකය 161අ වගන්තිය ප්‍රකාරව ආවේශ්‍ය කළ නොහැකි බවට යම් තැනැත්තකු විසින් සලකනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් එම පළකිරීමේ දිනයේ සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත එසේ පළකරන ලද භූගෝලීය දර්ශකය ලියාපදිංචි කිරීමට එරෙහි තම විරෝධය දැක්වෙන දැන්වීමක් නියමිත ගාස්තුව ද සමඟ නියමිත ආකෘතියෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත තැපෑලෙන් හෝ අතින් භාරදීම මගින් ඉදිරිපත් කරනු

ලැබිය හැකි ය. විරෝධය දැක්වෙන දැන්වීම ලබා දෙන තැනැත්තා විසින් එම විරෝධය දැක්වෙන දැන්වීම ඉදිරිපත් කිරීම සඳහා හේතු ද නිශ්චිතව දැක්විය යුතු අතර, එම හේතු සනාථ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සහ සාක්ෂි ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත විරෝධය දැක්වෙන දැන්වීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලැබී නොමැති අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 161ආ වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමට ඉල්ලා ඇති භූගෝලීය දර්ශකය ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(3) යම් විරෝධතා දැක්වීමක් එම දැන්වීමේ දින සිට මාස එකක කාලසීමාවක් ඇතුළත නියමිත ගාස්තු ද සමග එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති හේතු සනාථ කිරීම සඳහා වූ සාක්ෂි හෝ තොරතුරු ද සමඟින් නියමිත ආකෘතියෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලැබී ඇති අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම දැන්වීමේ පිටපතක් ඉල්ලුම්කරු වෙත භාර දී, එම දැන්වීම ලැබීමේ දින සිට මාස තුනක කාලසීමාවක් ඇතුළත ස්වකීය ඉල්ලුම් පත්‍රයට ආධාර පිණිස වන සාක්ෂි හෝ තොරතුරු ද සමඟින් ඒ හේතු සම්බන්ධ ස්වකීය නිරීක්ෂණ ඉදිරිපත් කරන ලෙස එම ඉල්ලුම්කරු වෙත නියම කරනු ලැබිය යුතු ය.

(4) ඉල්ලුම්කරුගේ නිරීක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලැබුණු විට, කරුණු විභාග කිරීම සඳහා අවශ්‍ය යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලැබුවහොත්, පාර්ශ්වකරුවන්ගේ කරුණු විභාග කිරීමෙන් පසු, ඒ භූගෝලීය දර්ශකය ලියාපදිංචි කළ යුතු ද නැද්ද යන්න අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හැකිතාක් ඉක්මනින් තීරණය කළ යුතු ය. ඒ භූගෝලීය දර්ශකය ලියාපදිංචි කළ යුතු යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කළහොත්-

(අ) ඔහුගේ තීරණයට එරෙහිව 173 වන වගන්තිය යටතේ කිසිදු අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක දී,

ඔහුගේ තීරණයට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි කාලසීමාව ඉකුත් වීමෙන් අනතුරුව; හෝ

(ආ) ඔහුගේ තීරණයට එරෙහිව 173 වන වගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී, එම අභියාචනය නිශ්ප්‍රභ කිරීමෙන් අනතුරුව,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම භූගෝලීය දර්ශකය යම් කොන්දේසිවලට හෝ නියමවලට යටත්ව හෝ අවශ්‍ය අවස්ථාවල දී, යම් සංශෝධන හෝ සුළු වෙනස් කිරීම්වලට යටත්ව ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

භූගෝලීය දර්ශක ලියාපදිංචිය අලුත් කිරීම

161ඉ. (1) යම් භූගෝලීය දර්ශකයක් ලියාපදිංචි කිරීම කලින් අවලංගු කර ඇත්නම් මිස, ඉල්ලුම් පත්‍රයේ දින සිට අවුරුදු දහයක කාලසීමාවක් සඳහා වලංගු වන්නේ ය.

(2) යම් භූගෝලීය දර්ශකයක හිමිකරු විසින්, එම භූගෝලීය දර්ශකයේ ලියාපදිංචිය ඉකුත් වීමට මාස හයකට පෙරාතුව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත එය අලුත් කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් නියමිත ගාස්තු ද සමග ඉදිරිපත් කිරීමෙන් අනුගාමී වසර දහයක කාලසීමා සඳහා එම භූගෝලීය දර්ශකයේ ලියාපදිංචිය අලුත් කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, නියම කරන ලද අධිභාරයක් ගෙවීමෙන් පසුව ලියාපදිංචිය අලුත් කිරීම සඳහා එම ලියාපදිංචිය ඉකුත් වීමේ දිනයෙන් පසු මාස හයක සහන කාලසීමාවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම්කරු වෙත ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(3) ලියාපදිංචිය අලුත් කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ භූගෝලීය දර්ශකය තවදුරටත් පරීක්ෂා කරනු ලැබීමට හෝ යම් තැනැත්තකුගේ විරෝධය පෑමකට යටත් නොවිය යුතු ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම භූගෝලීය දර්ශක අලුත් කිරීම සම්බන්ධයෙන් රෙජිස්ටරයේ සටහන් කළ යුතු අතර, එය ගැසට් පත්‍රයේ පළකිරීමට ද කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(5) (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි ඉල්លුම්කරු විසින් අලුත් කිරීමේ ගාස්තුව ද සමඟ අලුත් කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම භූගෝලීය දර්ශකය, භූගෝලීය දර්ශක රෙජිස්ටරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ XXXIIIඅ, XXXIIIආ, XXXIIIඇ, XXXIIIඈ සහ XXXIIIඉ අලුත් පරිච්ඡේද ඇතුළත් කිරීම

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 161ඉ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පරිච්ඡේද මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම පරිච්ඡේද එම ප්‍රඥප්තියේ XXXIIIඅ, XXXIIIආ, XXXIIIඇ, XXXIIIඈ සහ XXXIIIඉ පරිච්ඡේද වශයෙන් බලාත්මක විය යුතු ය:–

“XXXIIIඅ වන පරිච්ඡේදය

**භූගෝලීය දර්ශකය ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම සහ භූගෝලීය දර්ශක රෙජිස්ටරය**

ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම

161ඊ. මේ කොටස යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යම් ඉල්ලුම් පත්‍රයක් යථා පරිදි ලියාපදිංචි කර ඇත්නම්, සහතිකය සඳහා නියමිත ගාස්තු ලැබීමෙන් පසු ඔහු විසින්, ලියාපදිංචි කිරීමේ සහතිකය නියමිත ආකෘතියෙන් (මෙහි මින්මතු "ලියාපදිංචි හිමිකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) භූගෝලීය දර්ශකයේ හිමිකරු වන ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

භූගෝලීය දර්ශක රෙජිස්ටරය

161උ. (1) ලියාපදිංචි කරන ලද සියලුම භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීමේ අනුපිළිවෙළ අනුව වාර්තා කළ යුතු "භූගෝලීය දර්ශක රෙජිස්ටරය" යනුවෙන් හඳුන්වනු ලබන රෙජිස්ටරයක්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කාර්යාලයෙහි තබා ගැනීම සහ පවත්වාගෙන යාම කරනු ලැබිය යුතු ය.

(2) භූගෝලීය දර්ශක රෙජිස්ටරයෙහි පහත දැක්වෙන විස්තර ඇතුළත් කළ යුතු යඃ-

(අ) භූගෝලීය දර්ශකය;

(ආ) ලියාපදිංචි අංකය;

(ඇ) භූගෝලීය දර්ශකයේ හිමිකරුගේ නම සහ ලිපිනය, සහ ලියාපදිංචි හිමිකරු ශ්‍රී ලංකාවෙන් පිටත සිටින්නේ නම්, ශ්‍රී ලංකාව තුළ ලිපි භාරදීම සඳහා තැපැල් ලිපිනයක්;

(ඈ) ඉල්ලුම් කරනු ලැබූ සහ ලියාපදිංචි කරනු ලැබූ දිනය;

(ඉ) භූගෝලීය දර්ශකය ලියාපදිංචි කිරීම ප්‍රදානය කරනු ලැබ ඇත්තේ යම් භාණ්ඩ ලැයිස්තුවක් සම්බන්ධයෙන් ද, එකී භාණ්ඩ ලැයිස්තුව;

(ඊ) පිරිවිතර පිළිබඳ සාරාංශය;

(උ) භූගෝලීය ප්‍රදේශයේ සිතියම; සහ

(ඌ) පිරිවිතර සහ සම්බන්ධිත පාලන සැලැස්ම.

(3) යම් තැනැත්තකු විසින් නියමිත ගාස්තුව ගෙවා භූගෝලීය දර්ශක රෙජිස්ටරය පරීක්ෂා කිරීම සහ ඒ රෙජිස්ටරයේ සහතික කළ උද්ධෘත පිටපත් ලබා ගැනීම ද කරනු ලැබිය හැකි ය.

XXXIIIආ වන පරිච්ඡේදය

## ලියාපදිංචි හිමිකරුවකුගේ අයිතිවාසිකම් සහ භූගෝලීය දර්ශක රෙජිස්ටරය පරිපාලනය කිරීම

ලියාපදිංචි හිමිකරුවකුගේ අයිතිවාසිකම්

161ඌ. (අ) භූගෝලීය දර්ශකය අදාළ වන්නේ යම් භාණ්ඩයකට ද එම වර්ගයේ භාණ්ඩ සම්බන්ධයෙන්-

(i) ප්‍රස්තුත භූගෝලීය දර්ශකයෙන් පෙන්නුම් කරන ස්ථානයේ සම්භවයක් නොමැති කෘෂි නිෂ්පාදනයක්, ආහාර, වයින් හෝ ස්ප්‍රීතු හෝ නිෂ්පාදනය කරන ලද හස්ත කර්මාන්ත භාණ්ඩ සහ ස්වභාවික භාණ්ඩ ඇතුළු භාණ්ඩ හඳුනාගැනීම සඳහා හෝ භාණ්ඩවල සත්‍ය සම්භවය දක්වා ඇති අවස්ථාවක වුව ද, භූගෝලීය දර්ශකය භාවිත කිරීම සඳහා අදාළ වෙනත් යම් අවශ්‍යතාවයකට අනුකූල නොවන්නා වූ අවස්ථාවක හෝ භූගෝලීය දර්ශකය, පරිවර්තිත ආකෘතියෙන් හෝ "පන්නය", "ආකාරය", "වර්ගය", "මෝස්තරය", "අනුකරණය", "ක්‍රමය", "නිපදවා ඇති ආකාරයෙන්ම", "වැනි", "සමාන" යන යෙදුම් හෝ ඒ හා සමාන යෙදුමක් සමඟ භාවිත කර ඇති අවස්ථාවක භූගෝලීය දර්ශකයක යම් ඍජු හෝ වක්‍ර භාවිතයක්, අවභාවිතයක්, අනුකරණයක් හෝ ජනිත කිරීමක් වැළැක්වීම සඳහා; හෝ

(ii) පනතේ 160 වන වගන්තියේ අර්ථානුකූලව අසාධාරණ තරගකාරී ක්‍රියාවක් සංයුක්ත වන ආකාරයෙන් යම් භූගෝලීය දර්ශකයක යම් ඍජු හෝ වක්‍ර භාවිතයක්, අවභාවිතයක්, අනුකරණයක් හෝ ජනිත කිරීමක් වැළැක්වීම සඳහා; හෝ

(iii) කෘෂි නිෂ්පාදනයක්, ආහාර, වයින් හෝ ස්ප්‍රීතු හෝ සාදන ලද හස්ත කර්මාන්ත ඇතුළු භාණ්ඩවල සහ ස්වාභාවික භාණ්ඩවල සත්‍ය සම්භවය, ප්‍රභව ස්ථානය හෝ ස්වභාවය පිළිබඳ පාරිභෝගිකයන් නොමඟ යැවීමට ඉඩ ඇති වෙනත් යම් පරිචයක් වැළැක්වීම සඳහා,

(ආ) භූගෝලීය දර්ශකය අදාළ වන්නේ යම් වර්ගයක භාණ්ඩයකට ද, එම වර්ගයට අයත් නොවන භාණ්ඩ සම්බන්ධයෙන්-

(i) ප්‍රස්තුත කෘෂි නිෂ්පාදනයක්, ආහාර, වයින් හෝ ස්ප්‍රීතු හෝ නිෂ්පාදනය කරන ලද හස්ත කර්මාන්ත භාණ්ඩ සහ ස්වාභාවික භාණ්ඩ ඇතුළු භූගෝලීය දර්ශකය අදාළ වන වර්ගයට අයත් නොවන භාණ්ඩ සම්බන්ධයෙන් භාවිත කිරීම මගින් එම භාණ්ඩ සහ භූගෝලීය දර්ශකය අතර යම් සම්බන්ධතාවක් පෙන්නුම් කරන්නේ නම් හෝ නම් සහ හැඟවෙන්නේ භූගෝලීය දර්ශකයේ භාවිත කරන්නන්ගේ බැඳියාවන්වලට හානියක් සිදුවීමට ඉඩ ඇත්නම් හෝ අදාළ වේ නම්, භූගෝලීය දර්ශකයේ කීර්ති නාමය සැලකිල්ලට ගත් කළ එබඳු යම් භාවිත කිරීමකින් එකී කීර්ති නාමය අසාධාරණ අන්දමින් හානියට ලක් කිරීමට හෝ බාල කිරීමට තුඩු දෙන හෝ එම කීර්ති නාමයෙන් අසාධාරණ වාසි ලබා ගැනීමට ඉඩ ඇත්නම්, එම දර්ශකය සෘජුව භාවිත කිරීමක්, අවභාවිතයක්, අනුකරණයක් හෝ ජනිත කිරීමක් වැළැක්වීම සඳහා; හෝ

(ii) ප්‍රස්තුත කෘෂි නිෂ්පාදන ආහාර, වයින් හෝ ස්ප්‍රීතු හෝ නිෂ්පාදනය කරන ලද හස්ත කර්මාන්ත සහ ස්වාභාවික භාණ්ඩ ඇතුළු භූගෝලීය දර්ශකය අදාළ වන භාණ්ඩ වර්ගයට අයත් නොවන භාණ්ඩ සම්බන්ධයෙන් භාණ්ඩවල සත්‍ය සම්භවය දක්වා ඇති අවස්ථාවක වුවද භූගෝලීය දර්ශකය අනුකරණයට හේතු විය හැකි හෝ භූගෝලීය දර්ශකය, පරිවර්තිත ආකෘතියෙන් හෝ "පන්නය", "ආකාරය", "වර්ගය", "මෝස්තරය", "අනුකරණය", "ක්‍රමය", "නිපදවා ඇති ආකාරයෙන්ම", "වැනි", "සමාන" යන යෙදුම් හෝ ඒ හා සමාන යෙදුමක් සමඟ භාවිත කර ඇති අවස්ථාවක හෝ, භූගෝලීය දර්ශකය සෘජුව භාවිත කිරීමක්, අවභාවිතයක්, අනුකරණයක් හෝ ජනිත කිරීමක් වැළැක්වීම සඳහා; හෝ

(iii) භාණ්ඩවල සත්‍ය සම්භවය, ප්‍රභව ස්ථානය හෝ ස්වභාවය පිළිබඳ පාරිභෝගිකයන් නොමඟ යැවීමට ඉඩ ඇති වෙනත් යම් ක්‍රියාවක් වැළැක්වීම සඳහා,

භූගෝලීය දර්ශකය ලියාපදිංචි හිමිකරුට හිමිකම ඇත්තේ ය.

**ලියාපදිංචි භූගෝලීය දර්ශකය වර්ග නාමයක් නොවිය යුතු බව**

161එ. මේ පනත යටතේ ලියාපදිංචි යම් භූගෝලීය දර්ශකයක්, භූගෝලීය දර්ශකයක් ලෙස එසේ ලියාපදිංචි කරන ලද භාණ්ඩයේ පොදු නාමය වශයෙන් සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන නාමය වන වර්ග නාමයක් නොවිය යුතු ය.

## XXXIIIඇ වන පරිච්ඡේදය

## භූගෝලීය දර්ශක ලියාපදිංචිය අවලංගු කිරීම

**භූගෝලීය දර්ශක ලියාපදිංචිය අවලංගු කිරීම**

161ඒ. (අ) භූගෝලීය දර්ශක ලෙස ලියාපදිංචි කරන ලද යම් භාණ්ඩ, ඒවා භූගෝලීය දර්ශක භාණ්ඩ වශයෙන් හඳුන්වාදෙනු ලබන විශේෂ ගුණාංගවලින් තොර වන අවස්ථාවක;

(ආ) යම් භූගෝලීය දර්ශකයක් ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ යම් කොන්දේසි සහ නියමයන්ට යටත්ව ද, ලියාපදිංචි හිමිකරු විසින් එකී කොන්දේසිවලට සහ නියමයන්ට අනුකූලවීමට අපොහොසත් වන අවස්ථාවක;

(ඇ) එම භූගෝලීය දර්ශකයේ ලියාපදිංචි හිමිකරු විසින් එම භූගෝලීය දර්ශකයේ ලියාපදිංචිය අවලංගු කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ලිඛිතව ඉල්ලා සිටින අවස්ථාවක; හෝ

(ඈ) ලියාපදිංචි හිමිකරු විසින්, 161ඉ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි භූගෝලීය දර්ශකය ලියාපදිංචිය අලුත් කිරීමට අපොහොසත් වන අවස්ථාවක,

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම භූගෝලීය දර්ශකයේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය හැකි ය.

XXXIIIඇ වන පරිච්ඡේදය

**විදේශීය භූගෝලීය දර්ශක**

**විදේශීය භූගෝලීය දර්ශක**

161ඔ. යම් විදේශීය භූගෝලීය දර්ශකයක්, අවස්ථාවෝචිත පරිදි, භූගෝලීය දර්ශකයක් හෝ සහතික ලකුණක් වශයෙන් සම්භවය ලද රටෙහි සුරක්ෂිතව පවතින තාක් කල් එම විදේශීය භූගෝලීය දර්ශකය ලංකාවේ ලියාපදිංචි කළ හැකි ය. මේ පනතේ භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම සඳහා අදාළ වන විධිවිධාන, එම විදේශ භූගෝලීය දර්ශකයට අදාළ විය යුතු ය.

XXXIIIඉ වන පරිච්ඡේදය

**විවිධ**

**ලියාපදිංචි භූගෝලීය දර්ශක වෙනස් කිරීම්**

161ඕ. තාක්ෂණ, විද්‍යා සහ භූගෝලීය ප්‍රදේශයේ සීමා නිර්ණයන් සංවර්ධනය වීම හේතුකොටගෙන යම් භූගෝලීය දර්ශකයක ලියාපදිංචි හිමිකරු විසින්, පිරිවිතර සහ සම්බන්ධිත පාලන සැලැස්ම සංශෝධනය කිරීමට අදහස් කරන්නේ නම්, ඔහු විසින්, ඒ සම්බන්ධයෙන් නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ගාස්තු සමග අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, යම් ලියාපදිංචි භූගෝලීය දර්ශකයක අනන්‍යතාවයට බලපාන, යම් සැලකිය යුතු සංශෝධනයක්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් භාරගනු නොලැබිය යුතු ය.

**මේ පනත යටතේ සහතික ලකුණක් ලෙස ලියාපදිංචි කර ඇති භූගෝලීය දර්ශක**

161ක. යම් භූගෝලීය දර්ශකයක් මේ පනත යටතේ සහතික ලකුණක් ලෙස ලියාපදිංචි කර ඇති යම් තැනැත්තකු විසින්, ඔහු කැමති වේ නම්, එම ලකුණ, 161ආ වගන්තිය යටතේ භූගෝලීය දර්ශකයක් ලෙස ලියාපදිංචි කළ හැකි ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 162 වන වගන්තිය සංශෝධනය කිරීම

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 162 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) (1) වන උපවගන්තියේ "කාර්මික සැලසුම්, ලකුණු, පේටන්ට් බලපත්‍ර සහ අසාධාරණ වෙළෙඳ තරග" යන වචන වෙනුවට "කාර්මික සැලසුම්, ලකුණු, පේටන්ට් බලපත්‍ර, භූගෝලීය දර්ශක සහ අසාධාරණ වෙළෙඳ තරග" යන වචන ආදේශ කිරීමෙන්;

(2) (8) වන උපවගන්තියේ -

(අ) (අ) ඡේදයේ "වෙළෙඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර, අසාධාරණ තරග" යන වචන වෙනුවට "වෙළෙඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර, භූගෝලීය දර්ශක, අසාධාරණ තරග" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ආ) ඡේදයේ "වෙළෙඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර, අසාධාරණ තරග" යන වචන වෙනුවට "වෙළෙඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර, භූගෝලීය දර්ශක, අසාධාරණ තරග" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 168 වන වගන්තිය සංශෝධනය කිරීම

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 168 වන වගන්තිය, එහි "පේටන්ට් බලපත්‍රය, ලකුණ හෝ" යන වචන වෙනුවට "පේටන්ට් බලපත්‍රය, ලකුණ හෝ භූගෝලීය දර්ශකය හෝ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 170 වන වගන්තිය සංශෝධනය කිරීම

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 170 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "පේටන්ට් බලපත්‍රයක හෝ ලකුණක හෝ අවස්ථාවෝචිත පරිදි මේ පනත යටතේ වෙනත් යම් ලියාපදිංචියක්" යන වචන වෙනුවට "පේටන්ට් බලපත්‍රයක, ලකුණක හෝ භූගෝලීය දර්ශකයක හෝ අවස්ථාවෝචිත පරිදි මේ පනත යටතේ වෙනත් යම් ලියාපදිංචියක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 172 වන වගන්තිය සංශෝධනය කිරීම

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 172 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) (1) වන උපවගන්තියේ "කාර්මික සැලසුම, පේටන්ට් බලපත්‍රය හෝ ලකුණ හෝ" මෙම පනතේ විධිවිධාන සලසා ඇති වෙනත් යම් කාරණයක්" යන වචන වෙනුවට "කාර්මික සැලසුමක්, පේටන්ට් බලපත්‍රය, ලකුණ, භූගෝලීය දර්ශකය හෝ" යන වචන ආදේශ කිරීමෙන්.

(2) (2) වන උපවගන්තියේ "කාර්මික සැලසුමේ, පේටන්ට් බලපත්‍රයේ ලකුණේ හෝ මෙම පනතේ විධිවිධාන සලසා ඇති වෙනත් කාරණයක" යන වචන වෙනුවට "කාර්මික සැලසුමේ, පේටන්ට් බලපත්‍රයේ, ලකුණේ, භූගෝලීය දර්ශකයේ හෝ මෙම පනතේ විධිවිධාන සලසා ඇති වෙනත් යම් කාරණයක" යන වචන ආදේශ කිරීමෙන්.

(3) (3) වන උපවගන්තියේ "කාර්මික සැලසුමක, පේටන්ට් බලපත්‍රයක, ලකුණක හෝ මෙම පනතේ විධිවිධාන සලසා ඇති කාරණයක" යන වචන වෙනුවට "කාර්මික සැලසුමක, පේටන්ට් බලපත්‍රයක, ලකුණක, භූගෝලීය දර්ශකයක හෝ මෙම පනතේ විධිවිධාන සලසා ඇති වෙනත් යම් කාරණයක" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 186අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 186 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම වගන්තිය එම ප්‍රඥප්තියේ 186අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු යः-

"භූගෝලීය දර්ශකයන්ට අදාළ වැරදි

186අ. ලකුණු සම්බන්ධයෙන් මේ කොටසේ නිශ්චිතව දක්වා ඇති වැරදි සහ දණ්ඩනවලට අදාළ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව භූගෝලීය දර්ශක සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 212 වන වගන්තිය සංශෝධනය කිරීම

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 212 වන වගන්තිය, එහි "සම්මුතිය"යන අර්ථ නිරූපණයේ "පේටන්ට් බලපත්‍ර හා ලකුණු ද මේ පනතේ විධිවිධාන සලසා තිබෙන වෙනත් යම් කාරණා " යන වචන වෙනුවට "පේටන්ට් බලපත්‍ර, ලකුණු, භූගෝලීය දර්ශක හෝ මේ පනතේ විධිවිධාන සලසා තිබෙන වෙනත් යම් කාරණා" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**16.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව